# පෙරළිකාර ඇබිත්තෝ



බිනුවරි සෙසාක්‍යා
බණ්ඩාර

# පෙරළිකාර ඇබිත්තෝ

බිනුවරී සෙසාක්යා බණ්ඩාර

කතෘ

කතෘගේ වෙනත් කෘති

1. එකමුතු වදුරු රංචුව
2. පුංචි යාලු මාලු
3. රෑ බදුලු දේශය

පාසල - මහමායා බාලිකා විදුහල

ඉගෙනුම ලබන පංතිය - 5 B

කෘතිය පළ කරන දිනය - 2025.02.08

ISBN - 978-624-208-450-3

# පිදුම

මේ පොත...
නංගිගේ දඟකාරකම් ඉවසන.....
නංගිට පණ වගේ ආදරය කරන.....
බාසිළු අයියටයි...
රමිරු අයියටයි...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණ ගත්කරණී"** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය


විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක කාලෙක පුංචි කූඹි ගමක් තිබුණා. ඒ ගමේ හිටපු කූඹි පනහකටත් වැඩිය ගම අතහැරලා ගිහින් තියෙනවා. ඒ හින්දා දැන් කූඹි දහයක් වගේ තමයි ඒ ගමේ ඉන්නේ. ගම දාලා කූඹි ගියේ ඒ ගම දුප්පත් හින්දා. හැබැයි මේ ගම දුප්පත් වෙලා තියෙන්නේ සල්ලි වලින් නෙවෙයි, කෑම වලින්. ඉතිං මේ ගමේ හිටියා ආනා කියල කූඹි ළමයෙක්. මේ ළමයා මේ ගමේ තියෙන දුප්පත්කම ගැන ලොකු

1



2

කළකිරීමකින් තමයි හිටියේ. ඒ හින්දා එයා මේකට විසඳුමක් කල්පනා කළා. ඊට පස්සෙ එයා සැලසුම් කළා, කූඹි ගමට අල්ලපු ගමේ තියෙන මිනිස්සු ඉන්න ගමට යන්න. ගිහින් මිනිස්සු ඉන්න ගමේ එක ගෙදරක තියෙන කුස්සියකින් කූඹි ගමට කෑම අරන් එන්න. ඊට පස්සෙ ආනා එයාගෙ හොඳම යාලුවා විල්ෆ්‍රට්ගෙන් උදව් ඉල්ලුවා.

විල්ෆ්‍රට් ඒකට කැමති වුණා.



විල්ෆ්‍රට් තව යාලුවෝ තුන්දෙනෙක් එක්කන් ඇවිත් ආනා එක්ක ගමන පිටත් වුණා. එයාලා කතා කර කර සතුටින් යනකොට මෙන්න දන්නෙම නැතුව මිනිස් ගමට ඇවිත්. මෙයාලා ගෙදරක් තෝරගෙන ඒක අස්සට ගිහින් කුස්සිය තියෙන තැන බැලුවා. ඊට පස්සෙ එයාලා කුස්සියෙ තිබුන කෑම හොයාගෙන එයාලට පුළුවන් තරම් කෑම ගමන් මලු වලට



දාගෙන කූඹි ගමට ගෙනිච්චා. ගමේ කූඹි සතුටින් බෙරිහන් දුන්නා. ඊට පස්සෙ කූඹි ඔක්කොම ඒ කෑම සතුටින් කෑවා. කූඹි ගමට ආයෙත් කෑම ඕනි වුණ නිසා කූඹි ඔක්කොම කෑම ගන්න ආයෙත් මිනිස් ගමට යන්න සූදානම් වුණා. කූඹි ගමේ ඔක්කොමලා හිස් මලු කරේ දාගෙන ගමන පිටත් වෙන්න යද්දිම මිනිස් ගමේ පොඩි ළමයෙක්ගේ කකුළක් ගමේ

කොනකට වැදුණා. මුළු කුඹි ගමේම කට්ටිය සහ එයාලගෙ නිවාසත් බේරුණා. ඒත් ආනාගෙ නිවස විතරක් විනාශ වුණා. ආනා ගොඩක් දුක් වුණා. ඒ අතරතුර විල්ෆ්‍රට් ගමේ අයට කිව්වා ආනා කෑම හොයන්න කොච්චර මහන්සි වුණාද කියලා. ඊට පස්සෙ ගමේ හැමෝම එකතු වෙලා දුකින් ඉන්න ආනාගෙ නිවස ඉක්මනින් හැදුවා. ආනා ඒක දැකලා ගොඩක් සතුටු



වුණා. ඊට පස්සෙ කූඹි ගමේ කට්ටිය එකතු වෙලා මිනිස් ගමෙන් කෑම ගොඩක් අරන් ආවා. ගමේ කූඹි හැමෝම ආනාට ප්‍රශංසා කළා. ඊට පස්සේ ආනා සහ ගමේ හැමෝම සතුටින් ජීවත් වුණා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා සොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණීය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්

ISBN – 978-624-208-450-3